# කර්මාන්තකරුවනට කාර්මික ජනපදවල බිම් කොටස්

කේ.ඩී. පද්මිනි
සහකාර අධ්‍යක්ෂිකා
කාර්මික ජනපද අංශය

ලෝකයේ බොහෝ රටවල් කර්මාන්ත සංවර්ධනයට සහායදීමක් ලෙස කර්මාන්ත ආරම්භ කිරීමට අවශ්‍ය සියළු යටිතල පහසුකම් එක්තැන් කොට සපුරාලන ප්‍රදේශ සකසා දෙනු ඇත. මෙම ස්ථාන විවිද නම් වලින් එක් එක් රටවල් හඳුන්වයි. එනම් කර්මාන්තපුර, කර්මාන්ත උද්‍යාන හා කාර්මික ජනපද ආදී වශයෙනි. මෙවැනි පහසුකම් සැලැස්වීමේ අරමුණ රටින් රටට ස්ථානයෙන් ස්ථානයට වෙනස්වනු ඇත. ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනයකර කර්මාන්ත ගමට ගෙනයාම හා නගරවල ඒකරාශීවී ඇති කර්මාන්ත නරගයෙන් ඈත් කිරීමේ අදහසත්, කර්මාන්ත ස්ථානගත කිරීමේලා දැරීමට වන මූලික වියදම් අඩුකිරීමත් යන කරුණු මූලික කරගෙන කාර්මික ජනපද පිහිටුවීම සිදුවී ඇත.

මේ අනුව ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නගාසිටුවාලීමේදී කාර්මික ජනපද පිහිටුවීම තුළින් දේශීය නිෂපාදකයාට අති මහත් සේවාවක් ලබාගත හැකිය. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය පුරෝගාමීව ඉටුකරන අතිවිශාල කාර්යභාරයේ එක් කොටසක් ලෙස දිවයින පුරා කාර්මික ජනපද පිහිටුවීමේ කර්තව්‍ය හඳුන්වාදිය හැකිය.

1957 දී ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව දිවයින පුරා කාර්මික ජනපද පිහිටුවා, එමගින් කර්මාන්ත සංවර්ධනය කරලීමට 1957 අංක: 49 දරණ කර්මාන්ත සංවර්ධන පනත අනුව කාර්මික සමාගම පිහිටුවන ලදී.

එමගින් 1960 දී මුල්ම කාර්මික ජනපද ලෙස ඒකල, පල්ලෙකැලේ හා අච්චුවේලි කාර්මික ජනපද පිහිටුවන ලදී. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් දැනට පිහිටුවා ඇති කාර්මික ජනපද පහත සඳහන් පරිදි වේ.

| දිස්ත්‍රික්කය | කාර්මික ජනපදය | ආරම්භ කළ වර්ෂය | ඉඩම් ප්‍රමාණය (අක්.) |
|---|---|---|---|
| ගම්පහ | ඒකල | 1962 | 62 |
| මහනුවර | පල්ලෙකැලේ | 1969 | 53 |
| කළුතර | හොරණ | 1978 | 27 |
| කුරුණෑගල | පන්නල | 1979 | 19 |
| පුත්තලම | ලුණුවිල | 1981 | 28 |

එකී කාර්මික ජනපද පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහත දක්වමි.

## කාර්මික ජනපදවල වාර්තමාන තත්ත්වය:

| | කාර්මික ජනපදය | පවරාදී ඇති ගණන | ව්‍යාපෘති ගණන | ක්‍රියාත්මක ව්‍යාපෘති ගණන |
|---|---|---|---|---|
| | **ගොඩනැගිලි ඒකක** | | | |
| | ඒකල | 44 | 31 | 27 |
| | පල්ලෙකැලේ | 35 | 24 | 19 |
| | **සංවර්ධිත බිම් කොටස්** | | | |
| 01. | ඒකල | 37 | 28 | 21 |
| 02. | පල්ලෙකැලේ | 46 | 32 | 27 |
| 03. | හොරණ | 69 | 19 | 18 |
| 04. | පන්නල | 23 | 13 | 10 |
| 05. | ලුණුවිල | 96 | 22 | 14 |
| 06. | පදුපගල | 13 | 12 | 12 |
| 07. | කළුදෑවල | 36 | 19 | 09 |
| 08. | කොලිඅන්න | 15 | 15 | 07 |
| 09. | වවුනියාව | 50 | 22 | 14 |
| 10. | ගලිගමුව | 12 | 10 | 08 |
| 11. | තන්නල | 71 | 16 | 05 |
| 12. | කරන්දෙණිය | 21 | 19 | 06 |
| 13. | මිහින්තලේ | 28 | 28 | 02 |
| 14. | නැදුන්ගම | 16 | 16 | 07 |
| 15. | පුස්සැල්ලාව | 10 | 03 | 01 |
| 16. | නැගම්පහ | 04 | 04 | 04 |

## ඒකල කාර්මික ජනපදය

ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මෙම ජනපදය අක්කර 62 කින් සමන්විතය. මෙය 1962 වර්ෂයේ ආරම්භ කරන ලදී.1966 අවසන් වන විට මූලික පහසුකම් සපුරා කර්මාන්තකරුවන් වෙත භාරදීමට කටයුතුකර ඇත. මෙම ජනපදයේ කර්මාන්තශාලා 44 ක් පිහිටුවා ඇති අතර, සංවර්ධිත බිම් කොටස් 37 කින් යුක්ත වේ. සියළුම බිම් කොටස් හා ගොඩනැගිලි කර්මාන්තකරුවන් 59 දෙනෙකුට කර්මාන්ත පිහිටුවීම සඳහා ලබාදී ඇත.

## මහනුවර පල්ලේකැලේ කාර්මික ජනපදය

මෙම ජනපදය අක්කර 68 කින් සමන්විතය. 1969 එය ආරම්භ කරන ලදි. ගොඩනැගිලි 35 ක් සහ සංවර්ධිත බිම් කොටස් 46 ක් කර්මාන්තකරුවන්ගේ ව්‍යාපෘති සඳහා ලබාදී ඇත.

## හොරණ කාර්මික ජනපදය

අක්කර 27 කින් සමන්විත මෙම ජනපදය පිහිටා ඇත්තේ කළුතර දිස්ත්‍රික්කය තුළය. 1978 මෙම ජනපදය ආරම්භ කර ඇත. සංවර්ධිත බිම් කොටස් 69 ක් කර්මාන්තකරුවන්ගේ ව්‍යාපෘති පිහිටුවීම සඳහා පවරා දී ඇත.


## ලුණුවිල කාර්මික ජනපදය

පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ලුණුවිල ජනපදයට ඉඩම් අක්කර 28 1/4 ක් අයත්වේ. 1981 ආරම්භ කරන ලද මෙම ජනපදයේ සංවර්ධිත බිම් කොටස් 96 ක් ඇති අතර, සියළුම බිම් කොටස් කර්මාන්ත සඳහා කර්මාන්තකරුවන් වෙත භාරදී ඇත.

සංචාරක හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය යටතේ 1992 වර්ෂයේ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධනයෙහිලා සුළු කාර්මික ජනපද ඇති කිරීමේ මූලික පරමාර්ථය කරගෙන බද්දේගම, කරන්දෙනිය, පුස්සැල්ල, වවුළුගල, නෑගම්පහ, වවුනියාව, කළුදෑවල, කාර්මික ජනපද ආරම්භ කරන ලදි. මෙම කාර්මික ජනපද සඳහා මූලික පහසුකම් දැනට සපුරා කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා සුළු කර්මාන්තකරුවනට ලබාදී ඇත.

මෙම ජනපදවලට අදාළ විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | වර්ෂය | කා.ජනපදය | අක්කර | සංවර්ධිත බිම් කොටස් |
|---|---|---|---|---|
| කෑගල්ල | 1992 | ගලිගමුව | 4.4 | 15 |
| ගාල්ල | 1993 | කරන්දෙණිය | 1.5 | 21 |
| ගාල්ල | 1993 | බද්දේගම | 2.5 | 15 |
| කළුතර | 1993 | වවුළුගල | 18 | 41 |
| අනුරාධපුරය | 1993 | නෑගම්පහ | 05 | 46 |
| අනුරාධපුරය | 1993 | මිහින්තලේ | 05 | 32 |
| මාතලේ | 1993 | කළුදෑවල | 08 | 46 |
| වවුනියාව | 1993 | පූන්තතෝන්ඩම් | 10 | 64 |
| රත්නපුරය | 1993 | පුස්සැල්ල | 08 | 31 |
| හම්බන්තොට | 1995 | බෙලිඅත්ත | 10 | 35 |



## ජනපදවල මූලික ලක්ෂණ

- කර්මාන්තයක් ඇරඹීම සඳහා අවශ්‍ය විදුලි බලය, මාර්ග, ජල සම්පාදනය, කසල කාණු, කාර්මික අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රම ආදී මූලික පොදු පහසුකම් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සැලසීම.
- ඉඩම් ලබාදීමේදී නිෂ්පාදන හා සේවා සැපයීමේ කර්මාන්ත සඳහාත්, දේශීය අමුද්‍රව්‍ය යොදාගත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහාත් ප්‍රමුඛත්වයක් ලබාදීම.
- නව කර්මාන්ත හා පවතින කර්මාන්ත ආරම්භ කිරීම සඳහා තෝරාගත් ව්‍යවසායකයන්ට අදාළ ව්‍යාපෘතිය අනුව බිම් කොටස් ලබාදීම.
- ගොඩනැගිලි වසර 10 ක බදු කාලයක් සඳහාත්, බිම් කොටස් වසර 30 ක බදු කාලයක් සඳහාත් බදු දෙනු ලැබේ.
- රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වටිනාකම් අනුව ඉඩම් තක්සේරු වටිනාකමින් 4% ක ප්‍රමාණය සාමාන්‍ය බද්ද ලෙස අය කරනු ඇත.
- මණ්ඩලය වෙත ගොඩනැගිලි සැලසුම් ඉදිරිපත්කර, සිවිල් ඉංජිනේරුවරයාගේ අනුමැතිය ලබා බිම් කොටස් වල තමා විසින් ගොඩනැගිලි සාදාගත යුතුය.
- ඉඩම් පැවරීමේදී වාර්ෂික බදු කුලිය හා තුන් අවුරුදු ඇප තැන්පත් මණ්ඩලයට ගෙවිය යුතුය.

**බදු දීමේ කොන්දේසි** :

ප්‍රධාන කොන්දේසි වලින් කිහිපයක් පහත දැක්වේ.

- සංවර්ධිත බිම් කොටස් වසර 30 ක (බිම් කොටස් සඳහා ) හා ගොඩනැගිලි වසර 10 ක කාලයකට බදු දෙනු ඇත. කර්මාන්තකරු ඉල්ලීම් කළහොත් කාර්මික සංවර්ධන මණ්ඩලයේ කැමැත්ත පරිදි එම බදු කාලය දීර්ඝ කළ හැකිය.
- ඉඩම භාරදුන් දින සිට බද්ද ආරම්භවන අතර, මාස 3 ක් ඇතුළත බදුකරු ප්‍රමාණවත් වැටක් හෝ සීමා තාප්පයක් බැඳ අදාළ ඉඩම් කොටස වෙන්කර ගත යුතුයි.
- කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇති කර්මාන්තය වෙනස් කරන්නේ නම්, ඒ සඳහා මණ්ඩලයට කලින් දැනුම්දී අනුමැතිය ලබා ගත යුතුය.
- කර්මාන්තශාලා ගොඩනැගිල්ල සඳහා වියදම බදු කරු විසින් දැරිය යුතු වේ. එම ගොඩනැගිලිවල විදුලිය සවිකිරීම්, ජලය සැපයීම්, කසල කාණු සහ ඒවාට කරනු ලබන වැඩි දියුණු කිරීම් හා ඒවායේ සැළසුම් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගෙන ඉටු කළ යුතු වේ.
- බදුකරු විසින් සියලුම ගොඩනැගිලි හා ඉඩම් තුළ ඇති යන්ත්‍රෝපකරණ, අමු ද්‍රව්‍ය, නිමි ද්‍රව්‍ය නැතිවීම, අලාභ හානි වීම ආදිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රක්ෂණය ලබාගත යුතු වේ. ඒ පිළිබඳව මණ්ඩලය වගකියනු නොලැබේ.
- බදුකරු විසින් මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන ගොඩනැගිල්ල හෝ ඊට අනුබද්ධ කිසිවක් අතුරු බදුදීම නොකළ යුතුයි.
- විදුලි බලය හා දුරකථන ගාස්තු බදුකරු විසින් දැරිය යුතුයි.
- බද්ද අවසන් වූ විට තමාට පවරා ඇති ඉඩම හෝ ගොඩනැගිල්ල කිසිඳු වන්දියක් නොමැතිව මණ්ඩලයට ආපසු භාර දිය යුතුයි.
- කාර්මික සංවර්ධන මණ්ඩලය සහ බදුකරු අතර අත්සන් තැබිය යුතු බදු ගිවිසුමකට වෙනත් කොන්දේසි අතර ඉහත කොන්දේසි ද ඇතුළත් වනු ඇත. මණ්ඩලය විසින් ඉල්ලන ලද වහාම විධිමත් නොතාරීය බදු ගිවිසුමකට ඇතුළත්වීමට බදුකරු පොරොන්දු විය යුතුයි.

**බිම් කොටස් බදු ගැනීමේදී කර්මාන්තකරු විසින් ඉටු කළයුතු කාර්යය**

- සංවර්ධිත බිම් කොටස් පවතින හෝ නව කර්මාන්තයක් සඳහා ලබා ගැනීමේදී අයදුම්පතක් සම්පූර්ණකර, ව්‍යාපෘති විස්තර ඇතුළත් වාර්තාවක් සමග මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.
- ව්‍යාපෘති වාර්තාව හා අයදුම්පත ලැබුනු පසු කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ කමිටුවක් මගින් ඇගයීම් කර ලකුණු ක්‍රමයක් මත සුදුසු කර්මාන්තකරුවන් තෝරාගනු ලැබේ.
- තෝරාගනු ලැබූ කර්මාන්තකරුවන් පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.
    - ❖ ව්‍යාපාර නාම ලියාපදිංචි ලිපියේ පිටපතක්
    - ❖ මධ්‍යම පරිසර අධිකාරියේ අනුමත ලිපිය
    - ❖ ගොඩනැගිලි සැලසුම්
    - ❖ ක්‍රියාත්මක සැලැස්ම (ගොඩනැගිලි ඉදිරිකිරීමේ සිට නිෂ්පාදනය ඇරඹීම දක්වා සැලැස්ම)
- අදාල ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් අනතුරුව බිම් කොටස වෙනුවෙන් ගෙවිය යුතු වාර්ෂික බදු කුලී හා තුන් අවුරුදු ඇප තැන්පත් අයකර ගැනීමෙන් පසු බිම් කොටස පැවරීම කරනු ලැබේ.
- ගොඩනැගිලි සඳහා මාසික බදු කුලිය හා සය මසක ඇප තැන්පත් ලබාගැනීමෙන් අනතුරුව ගොඩනැගිල්ල භාරදීම ඉටු කරනු ඇත.

